०८

अष्टमः पाठः ।

# प्रारब्धमुत्तमजना न परित्यजन्ति ।

## समासपरिचयः ।

### द्विगुसमासः ।

त्रयाणां भुवनानां समाहारः - त्रिभुवनम् - තුන්ලොව
त्रयानां सिंहलानां समाहारः - त्रिसिंहलम् - ත්‍රිසිංහලය
अष्टानाम् अध्यायानां समाहारः - अष्टाध्यायी - අෂ්ටධ්‍යායී

අර්ථ වශයෙන් යම් සමූහයක් හෝ කොටසක් ගැන කියැවෙන සංඛ්‍යාවාචී පදයක් සහ උත්තරපදයක් අතර සිදුවන සංක්ෂිප්තතාව ද්විගු සමාසය යි. කර්මධාරය සමාසයෙන් මෙය වෙනස් වන්නේ විශේෂණ පදය ලෙස සංඛ්‍යාවාචී ශබ්දයක් යෙදෙන බැවිනි. මෙම සමාසයේ පූර්වපදය ලෙස යෙදෙන්නේ එම සංඛ්‍යාවාචී පදය යි. (**සංඛ්‍යාපූර්වෝ ද්විගුඃ**) ඉහත දක්වා ඇති පද කිසියම් සංඛ්‍යාර්ථයක් ප්‍රකාශ කෙරේ.

द्विगुः
- समाहार द्विगुः
- असमाहार द्विगुः

- සමාහාර ද්විගු ප්‍රභේදයේ සමාසපදය නපුංසකලිංග ද, ඒකවචනාන්ත ද වේ.

पञ्चानि शीलानि समाहारः - पञ्चशीलम्
पञ्चानां पात्राणां समाहारः - पञ्चपात्रम्
त्रयाणां रात्रीणां समाहारः - त्रिरात्रम्

- ඇතැම් ස්ථානයන්හි සමාහාර ද්විගු සමාසපදය ඊකාරාන්ත හා ස්ත්‍රීලිංග ද වේ.

त्रयाणां लोकानां समाहारः - त्रिलोकी
दशानां ग्रामानां समाहारः - दशग्रामी
सप्तानां शतानां समाहारः - सप्तशती
चतुर्णां पथाम् समाहारः - चतुष्पथम्

• මෙම සමාස ප්‍රභේදයේ සංඛ්‍යාවාචී පදය අගට යෙදෙන අවස්ථා ද ඇත.

द्वयोः वचनयोः समाहारः - वचनद्वयम्
त्रयाणां द्वाराणां समाहारः - द्वारत्रयम्
त्रयाणां रत्नानां समाहारः - रत्नत्रयम्

• අසමාහාර ද්විගු සමාසය ඒකත්වයට නොපැමිණෙයි. නපුංසකලිංග ද ඇසුරු නොකරයි. පරපදයේ ලිංගය ම ගනියි.

सप्तश्च ते ऋषयश्च - सप्तर्षयः
अष्टौ च ताः स्त्रियश्च - अष्टस्त्रियः
दश च तानि पद्मानि - दशपद्मानि

**ක්‍රියාකාරකම 8.1**

1. පහත සඳහන් සමාස විග්‍රහයන් සඳහා වූ නිවැරදි සමාසපදය ලියන්න.

०१. सप्तानां पदानां समाहारः ..................................
०२. शतस्य शब्दानां समाहारः ..................................
०३. चतुर्णां सूत्राणां समाहारः ..................................
०४. पञ्चानाम् अङ्गानां समाहारः ..................................
०५. त्रयाणां लक्षणानां समाहारः ..................................
०६. त्रयाणां दिनानां समाहारः ..................................
०७. पञ्चानां वटानां समाहारः ..................................
०८. सप्तानां अब्दानां समाहारः ..................................
०९. दशानां रात्रीणां समाहारः .................................
१०. पञ्चानां मञ्चानां समाहारः .................................
११. त्रयोः पात्रयोः समाहारः .................................
१२. अष्टानां पादानां समाहारः .................................

2. පහත සඳහන් සමාසපදයන්හි විග්‍රහ වාක්‍යය සකසන්න.

०१. पञ्चवटी ...................... ०२. पञ्चगवम् .....................
०३. त्रिरात्रम् ...................... ०४. पञ्चपात्रम् ......................
०५. त्रिचैत्यम् ...................... ०६. द्विपात्रम् ......................
०७. चतुर्युगम् ...................... ०८. पञ्चराजी ......................
०९. पञ्चमालम् ...................... १०. चतुर्बुद्धी ......................

## कर्मधारयसमासः ।

मधुरवचनम्
शीघ्रगामी
धर्मजीवितम्
पादपद्मम्

ඉහත වෘත්තයේ ඇත්තේ නිතර අපට හමුවන වචන කිහිපයකි. මිහිරි වචනය, වේගවත් ගමන, දැහැමි ජීවිතය, පා පියුම යනු උක්ත ශබ්දයන්ගේ අනුපිළිවෙළ අර්ථයි. මේවා සකස් වී ඇත්තේ කිසියම් විශේෂ්‍යයක් හෝ විශේෂණයක් මුල් වීමෙනි. එබැවින් විශේෂ්‍ය හා විශේෂණ පදයන්ගේ සංක්ෂිප්තතාව තුළින් සැකසෙන පද කර්මධාරය සමාසයට අයත් වේ. මෙය උත්තර පද ප්‍රධාන සමාසයකි. තත්පුරුෂ සමාසයේ ප්‍රභේදයක් ද වේ.

| | |
|---|---|
| नीलश्च असौ आकाशश्च | = नीलाकाशः |
| वीरश्च स पुरुषश्च | = वीरपुरुषः |
| पवित्रं च तत् स्थानं च | = पवित्रस्थानम् |
| शारिपुत्रश्च स स्थविरश्च | = शारिपुत्रस्थविरः |
| मन्दं च तत् शीतलं च | = मन्दशीतलम् |

මෙසේ එක ම වස්තුවක් හැඟවෙන යෝග්‍ය වූ විශේෂ්‍ය විශේෂණ පදයන්ගේ සංයෝගයෙන් කර්මධාරය සමාසය නිර්මාණය වන බව පැහැදිලි ය. සමස්ත සමාසයේ ලිංගය තීරණය වන්නේ පරපදයට අනුව ය.

विद्याधनम्　　महाजलम्　　धीरपुरुषः　　वङ्कानदी

पूर्व ශබ්දය සැමවිට ම සමාසපදයේ අගට එකතු වේ.

भूतपूर्व　　दृष्टपूर्व　　कृतपूर्व　　श्रुतपूर्व

කර්මධාරය සමාසයෙහි ප්‍රභේද නමයක් දැකිය හැකි ය. පහත වගුවෙහි දැක්වෙන්නේ එම සමාස ප්‍රභේද හා ඒවාට අදාළ උදාහරණ යි.

| नाम | विग्रहः | समासः |
|---|---|---|
| १. विशेषणपूर्वपदः | दुष्टश्च सः नरश्च<br>प्रिया च सा भार्या च<br>मधुरञ्च तं फलञ्च | दुष्टनरः<br>प्रियभार्या<br>मधुरफलम् |
| २. विशेषणोत्तरपदः | अश्वघोषश्च सः यतिश्च<br>ब्राह्मणश्च सः धीरश्च<br>पुलस्तिश्च सः मुनिश्च | अश्वघोषयतिः<br>ब्राह्मणधीरः<br>पुलस्तिमुनिः |
| ३. विशेषणोभयपदः | दृढश्च सः शीतलश्च<br>रमणीया च सा शुक्ला च<br>शीतञ्च तं उष्णञ्च | दृढशीतलः<br>रमणीयशुक्ला<br>शीतोष्णम् |
| ४. उपमानपूर्वपदः | चन्द्र इव मुखम्<br>शैल इव स्तब्धः<br>अग्नि इव दीप्तः | चन्द्रमुखम्<br>शैलस्तब्धः<br>अग्निदीप्तः |
| ५. उपमानोत्तरपदः | सिंहः इव नरः<br>पद्मम् इव पादः<br>लता इव तनुः | नरसिंहः<br>पद्मपादः<br>तनुलता |
| ६. सम्भावनापूर्वपदः | गुण इति बुद्धिः<br>श्रीपादः इति पर्वतः<br>तृष्णा इति व्याजः | गुणबुद्धिः<br>श्रीपादपर्वतः<br>तृष्णाव्याजः |
| ७. अवधारणापूर्वपदः | धर्म एव जीवितम्<br>गुरुः एव देवः<br>तपः एव धनम् | धर्मजीवितम्<br>गुरुदेवः<br>तपोधनम् |
| ८. न निपात पूर्वपदः | न आगतः<br>न गुणः<br>न कालः | अनागतः<br>अगुणः<br>अकालः |
| ९ प्रादि पूर्वपदः | प्रकृष्टः गुणः<br>कुत्सितः कविः<br>प्रकृष्टः आचार्यः | प्रगुणः<br>कुकविः<br>प्राचार्यः |

උදාහරණ:-

**नीलमेघः**

මෙහි **नील** යනු විශේෂණ පදය යි. එය පූර්වපදය ලෙස සිටී. **मेघः** යනු උත්තරපදය යි.

**नीलश्च स मेघश्च - नीलमेघः**

1. පහත සඳහන් විග්‍රහ වාක්‍යවලට අදාළ සමාස සකසමු.

०१. महान् च असौ प्रभूः च ..................................
०२. सुन्दरी च सा नारी च ..................................
०३. महान् च असौ धनिकः च ..................................
०४. उदारः च असौ जनः ..................................
०५. चरणः कमलम् इव ..................................
०६. शुक्लः च असौ अश्वश्च ..................................
०७. नीलं च तत् कण्ठं च ..................................
०८. चन्दन इव शीतला ..................................
०९. दुग्धम् इव धवलाः ..................................
१०. नवनीतम् इव कोमलम् ..................................
११. पीतं च तत् अम्बरम् ..................................
१२. दुष्टश्च सः जनः च ..................................

2. ඉහත සඳහන් සමාසපද අධ්‍යයනය කරමින් පහත සමාසපදයන්හි විග්‍රහ වාක්‍ය සොයමු.

| | |
|---|---|
| रम्यलता | विद्याधनम् |
| धर्मबुद्धि | मृगराजा |
| मुखकमलम् | श्वेतपद्मानि |
| अनागत | ब्राह्मणपण्डितः |
| चोरभयम् | शीलधनम् |

| | |
|---|---|
| सुन्दरमृगः | कृष्णश्वेतः |
| पुरुषव्याघ्रः | लतातन्वी |
| कुपुत्रः | अकृतम् |
| महापुरुषः | गुणबुद्धिः |

०१. ....................................... ०२. .......................................
०३. ....................................... ०४. .......................................
०५. ....................................... ०६. .......................................
०७. ....................................... ०८. .......................................
०९. ....................................... १०. .......................................

3. පහත වාක්‍ය අධ්‍යයනය කරන්න. සමාස පද තෝරන්න/සාදන්න. වාක්‍යවල අර්ථ ද ලියන්න.

०१. सरसि रक्तानि कमलानि विकसितानि सन्ति।
०२. सतां चित्तं उत्पलम् इव कोमलं भवति।
०३. तत्र एकं हिमधवलं गृहम् अस्ति।
०४. माता पुत्रस्य मुखकमलं पश्यति।
०५. समुद्रमन्थनात् निर्गतं गरलं महता वेगेन पीतम्।

## बहुव्रीहि समासः।

योगीश्वरं दशबलं लोकज्ञं लोकपूजितम्
लोकाचार्यं निराचार्यंलोकनाथं नमाम्यहम्

दशानि बलानि यस्य सः दशबलः > बुद्धः

සමාස වන පදයන්හි අර්ථයට පරිබාහිර වෙනත් අර්ථයක් ඉස්මතු කරලීම දක්නට ලැබෙන්නේ බහුව්‍රීහි සමාසයේ යි. මෙහි ප්‍රමුඛ වන්නේ ම සමාස වන පදයන් තුළින් බිහි වන අර්ථ සමානතා ඇති අන්‍යපදය යි. (अन्यपदार्थप्रधानः बहुव्रीहि)

त्रीणि नेत्राणि यस्य स त्रिनेत्रः > शिवः
पीतं क्षीरं येन सः पीतक्षीरः > बालः

උදාහරණ

| | |
|---|---|
| बहूनि फलानि<br>बहुफलः (वृक्षः) | चक्रं पाणौ<br>चक्रपाणिः (शक्रः) |
| लम्बौ कर्णौ<br>लम्बकर्णः (क्षत्रियः) | धर्मे बुद्धिः<br>धर्मबुद्धिः (शारिपुत्रः) |

- මෙහි විශේෂත්වය වනුයේ අන්ත්‍ය පදයේ ලිංගය ගැනීමයි. එම නිසා සමාසපදය එක් ලිංගයකට අයත් වුව ද අන්ත්‍ය පදයේ බලපෑමට අනුව ලිංගය තීරණය වේ.

- විග්‍රහ වාක්‍යයේ දී එම අන්‍යාර්ථය ප්‍රකාශ කිරීම පිණිස **यद्, तद्, एतद्, इदम् ,अदस्** යන සර්වනාම පද භාවිත කරයි.

**त्रीणि नेत्राणि यस्य सः - त्रिनेत्रः = शिवः** මෙහි ශිවඃ යන අන්‍යාර්ථය හැඟවීම සඳහා යොදාගෙන ඇත්තේ "**यस्य**" යන **यद्** ශබ්දයේ ෂෂ්ඨී විභක්ති ඒකවචනයත් **तद्** ශබ්දයේ ප්‍රථමා විභක්ති ඒකවචනයත් බව පැහැදිලි ය.

ප්‍රථමාදි විභක්ති සප්තකයට අදාළ ව බහුව්‍රීහි සමාසය පිළිබඳ ව තවදුරටත් විමසා බැලිය හැකි ය.

| नाम | विग्रहः | समासः |
|---|---|---|
| १. द्वितीयार्थबहुव्रीहिः | प्राप्तम् उदकं यः सः | प्राप्तोदकः (ग्रामः) |
| २. तृतीयार्थबहुव्रीहिः | पीतं क्षीरं येन सः | पीतक्षीरः (बालः) |
| ३. चतुर्थ्यर्थबहुव्रीहिः | दत्तः पशुः यस्मै सः | दत्तपशुः (विप्रः) |
| ४. पञ्चम्यर्थबहुव्रीहिः | उद्धृतं जलं यस्मात् सः | उद्धृतजलः (कूपः) |
| ५. षष्ठ्यर्थबहुव्रीहिः | बहूनि फलानि यस्य सः | बहुफलः (वृक्षः) |
| ६. सप्तम्यर्थबहुव्रीहिः | बहूनि मूलानि यस्मिन् सः | बहुमूलः (वृक्षः) |

විවිධ ලක්‍ෂණයනට අදාළ ව බහුව්‍රීහි සමාසය තවත් ප්‍රභේද කිහිපයකින් හඳුනාගත හැකි ය.

| නාමය | විග්‍රහය | සමාසය( ) |
|---|---|---|
| ද්විපද බහුව්‍රීහි සමාසය | छिन्नो वृक्षो येन सः | छिन्न वृक्षः - (फरुसुः) |
| ත්‍රි පද බහුව්‍රීහි සමාසය | सुलभानि अजिनानि वासांसि यस्य सः | सुलभाजिनवासः - (मुनिः) |
| සංඛ්‍යා පූර්ව පද බහුව්‍රීහි සමාසය | शतं पत्राणि यस्य सः | शतपत्रम् - (पद्मम्) |
| සංඛ්‍යෝත්තර පද බහුව්‍රීහි සමාසය | विंशतिः समीपे ये वर्तन्ते | उपविंशाः - (नराः) |
| සංඛ්‍යොභය පද බහුව්‍රීහි සමාසය | द्वौ न त्रयो वा | द्वित्राः - (नराः) |
| උපමාන පූර්ව පද බහුව්‍රීහි සමාසය | चन्द्रः इव मुखं यस्य सः | चन्द्रमुखः - (बालकः) |
| සහ පූර්ව පද බහුව්‍රීහි සමාසය | शिष्येण सह वर्तते इति | सशिष्यः - (गुरुः) |
| න පූර්ව පද බහුව්‍රීහි සමාසය | अविद्यमानः पुत्रः यस्य सः | अपुत्रः (अविद्यमानपुत्रः) |
| ප්‍රාදි පූර්ව පද බහුව්‍රීහි සමාසය | प्रकृष्टो वातो यस्मिन् सः | प्रवातः - (देशः) |
| දිගන්තරාල ලක්‍ෂණ බහුව්‍රීහි සමාසය | उत्तरस्याश्च दिशोः यदन्तरालम् | पूर्वोत्तरा - (ऐशानीदिशा) |
| ව්‍යතීහාර ලක්‍ෂණ බහුව්‍රීහි සමාසය | केशेषु केशेषु गृहीत्वा इदं युद्धं प्रवृत्तमिति | केशाकेशी - (युद्धम्) |

01. පහත වාක්‍යයන්හි ඇති සමාස පද තෝරන්න. සමාස නොකරන ලද පද සමාස කරන්න. වාක්‍යයන්හි අර්ථ ද ලියන්න.

०१. महात्मा बुद्धः विनयशीलः आसीत्।
०२. सिद्धार्थः शास्त्रेषु पारङ्गतः आसीत्।
०३. सा  दिनं दिनं प्रति दानं करोति स्म।
०४. हंसस्य पक्षाः दुग्धधवलाः सन्ति।
०५. युधिष्ठिरः भीमः अर्जुनः च कुन्त्याः पुत्राः आसन्।
०६. संसारः मरणशीलः अस्ति।
०७. सा पीतम् अम्बरं धारयति।
०८. सप्ताहे सप्तदिनानि भवन्ति।
०९. अहं भवतः शरणम् आगता।
१०. वृक्षारूढः वानराः कूर्दन्ते।
११. अविवेकः परमापदां पदम्।
१२. सः प्रत्यहं पठति यथेच्छं वदति।
१३. किं इदम् अनुरूपं साधु जनस्य ?
१४. कोकिलमयूरौ मधुरेन कूजतः।
१५. सिंहात् भीतः बालः कम्पते।
१६. बालकः अष्टाध्यायीं स्मरति।
१७. पाणिपादं प्रक्षाल्य भोजनं कुरु।
१८. तव पुत्राः च पौत्राः च चिरं जीवतु।
१९. संसारे जितेन्द्रियः एव सुखी।
२०. तत्र एका सुन्दरकन्या अस्ति।

पीत्वा मोहमयीं प्रमादमदीरामुन्मत्तभूतं जगत्।

මුළාව ඇති කරන පමාව නමැති සුරාව බී ලෝකයා උන්මත්තක වී ඇත.

पुण्यस्यफलमिच्छन्ति पुण्यं नेच्छन्ति मानवाः।

මිනිස්සු පින්වල ඵලය කැමති වෙති. පින් කිරීමට කැමති නොවෙති.

पुण्यैरेव हि लभ्यते सुकृतिभिः सत्संगतिर्दुर्लभा।

දුර්ලභ වූ සත්පුරුෂ ආශ්‍රය පුණ්‍යවන්තයන්ට ලැබෙන්නේ පින නිසා ම නොවේ ද?